




Welcome to LAKRUHUNU BUDDHIST Sri lanka Official Site

***ශ්‍රී. බු. ව. 2554 නිකිණි මස කලාපය. ව. ව. 2010 ක් වූ අගෝස්තු 24 වන දින***

**වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**
**ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

**දෙව්ලොව දේවත්වයට වඩා අගනා මිනිස්ලොව මිනිසත් බව**

(ඛුද්දක නිකාය- පූර්වනිමිත්ත සූත්‍රය ඇසුරිනි.)

*ධර්මකාමී පින්වතුනි,*

*අද ක්‍රි.ව. 2010 අගෝස්තු මාසයේ යෙදෙන නිකිණි පුර පසළොස්වක පොහොය දිනයයි. තථාගත පරිනිර්වාණයෙන් පසු ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම ද ඇසළ පෝදින වස් එළඹීමට නොහැකිවූ භික්ෂූන් වහන්සේලා පසුවස් එළඹීමද අද පෝදිනයේ වැදගත්කමයි.*

*අද මෙම ධර්ම පණිවුඩයට පාදක කරගත් මාතෘකාව වන්නේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් පූර්ව නිමිත්ත නම් සූත්‍රය යි. දිනක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ අමතා දිව්‍ය ලෝකයේ දෙවියන් අතර පවතින ස්වභාවයක් පිළිබඳව දේශනා කරනව.*

*යම් දෙවිකෙනෙක් දෙව්ලොවින් චුත වන අවස්ථාව උදාවෙත්ම (මරණය සිදුවන්නට ලංවෙත්ම) එම දේවතාවට පූර්වනිමිති පහක් පහළ වෙනව. දෙවියා*

පැළඳ සිටින මල් මැළ වෙයි. දිව්‍ය වස්ත්‍ර කිළිටි වෙයි. කිසිලි වලින් දහදිය වැගිරෙයි. ශරීර යෙහි දුර්වර්ණ බවක් ඇතිවෙයි. තමන්ගේ දිව්‍යමය විමානයේ (ආසනයේ) නොරැදෙයි. යනමේ නිමිති පහයි.

එසේ එම දිව්‍ය පුත්‍රයා මරණාසන්න වීමෙන් ලකුණු පහළ කරද්දී අනප්‍රු දෙවියන් පැමිණ දේවතාවා වටා රොක් වී වචන තුනකින් අස් වසන්නේ ''පින්වත මේ දෙව්ලොවින් චුතව සුගතියට යව. සුගතියට ගොස් මනාකොට ලැබූ ලාභය ලබව. සුලද්ධ ලාභය ලැබ සුප්පතිට්ඨිත වව'' යනුවෙන් භික්ෂූන් වහන්සේලාට තථාගතයන් වහන්සේ වදාළහ.

මෙසේ වදාළ කල්හි එහි උන්නා වූ එක්තරා ස්වාමීන් වහන්සේ නමක් ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ෟ දෙවියන්ගේ සුගති ගමන යනු කුමක් ද? දෙවියන්ගේ සුලද්ධ ලාභය කුමක්ද? දෙවියන්ගේ මනාකොට පිහිටීම යනු කුමක්ද? යනුවෙන් විමසීය.

''මහණෟ මිනිසත් බව දෙවියන්ගේ සුගති ගමනයි. තථාගත ධර්ම විනයෙහි සැදැහැවන්තයෙක් වීම සුලද්ධ ලාභයයි. එම ලබා ගත් සැදැහැය සිත තුළ ලොව කිසිවෙකුටත් නැති කළ නොහැකි පරිදි බැස ගත්තේද එය මනාකොට පිහිටීමය''යි වදාළහ.

තවදුරටත් එහි අර්ථය පැහැදිලි වීමට දෙව්ලොවින් චුත වීමට සූදානම් වන දිව්‍ය පුත්‍රයෙකුට අනප්‍රු දෙවියන් කරන ඉල්ලීම තවත් ගාථා හතකින් සවිස්තරව දේශනා කොට ඇත. එම ගාථාවලින් ඉහතකී අදහස ද ප්‍රකාශ වන අතර දෙවියන් විසින් චුතවන්නට සූදානම් වන දෙවියන්ට මෙම අදහස්ද සිතට ඇතුල් කරයි. ''කාය දුෂ්චරිතය වාග් දුශ්චරිතය, මනෝ දුෂ්චරිතය යන දෝෂයෙන් යුතු වෙනත් අකුසල් ද හැර තුන්දොරින් කුසල් කොට, දන් දීමෙන් ආයු, වර්ණ,සැප, බල, විපාක ඇති උපධිසම්පත් ඇතිව ඒ පින් බහුල වශයෙන් කොට අන්‍ය මනුෂ්‍යයෝද ධර්මයෙහි හා ශීලයෙහි පිහිටුවව''යනුවෙන් යහපත් අදහස් සිතට දී චුතවීමට ආසන්න දෙවියාට සිතෙහි

පවතින දුක නැතිකරනු පිණිස "දෙවියෟ නැවත නැවත මෙහිද උපදීවායි" ද අනුකම්පාවෙන් කියන බවද භාගපවතුන් වහන්සේ විසින් විස්තර වශයෙන් වදාළහ.

බුදුරජාණන් වහන්සේ විසින් දේශණාකොට වදාළ මෙම පුබ්බ නිමිත්ත සූත්‍රයෙන් අප ලද මනුෂ්‍ය ආත්මයට බොහෝ යහපත් උපදේශ රාශියක් උගන්වයි. ඉහත ද දැක්වූ පරිදි එම දේශනාව අසා සිටි භික්ෂූන් වහන්සේලා අතරින් එක්නමක් බුදුරජාණන් වහන්සේගෙන් කරුණු 3ක් විමසයි. ඒ අසා සිටි අපට වුව ද එකවර එසේ ඇසීමට සිත් උපදී. දෙවියන් යනු සත්වයන් උපදින ගති පහෙන් එකකි. එනම්, දිව්‍ය ,මනුෂ්‍ය, තිරිසන්, ප්‍රේත, සහ නිරය යන ගති පහෙන් පළමු කී "දිව්‍ය" නම් වූ ගතියයි. මවු පියාදී වැඩිහිටියන්ට සලකමින් දාන ශීලාදී උසස් ගුණ ධර්මයන් වැඩීමේ ප්‍රතිඵලය වශයෙන් මරණින් මතු දේවත්වයට පත්වෙති. එසේ වූ දෙවියන් සමග බුදුරජාණන් වහන්සේ ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පැවැත්වූ බව මහා මංගල සූත්‍රය ආදී සූත්‍ර දේශනා බොහොමයක ඇත. දිව්‍ය සැප විදින දෙවිවරුද එයින් චුතව (මරණයට පත්වී ) නැවත දුගතියෙහි හෝ සුගතියෙහි උපදින බව මේ සූත්‍ර දේශනාවට නිධාන වූ හේතුව අනුව පෙනේ. එමෙන්ම දිව්‍යලෝක වාසී දෙවියන්ද මනුෂ්‍ය ආත්මභාවය තරම් වටිනා දෙයක් තවත් නැති බව තහවුරු කරනව. එමෙන්ම පැහැපත් රූප සම්පත්තියක් ලද දෙවියන්ට වුවද චුත වීමට ආසන්න වන විට හෝ ජරා ධර්මය ඉක්ම වීමට නොහැකි වේ.

විටෙක බුදුරාජණන් වහන්සේ ඉදිරියට පැමිණි එක්තරා දේවතාවෙක් ස්වාමීනිෟ රෑ දාවල් ඉක්ම යති. වයස ගෙවේ. මරණයට ළං වේ. ඒනිසා පිං කළ යුතුයි නේද? යනුවෙන් විමසයි. බුදුහිමියන් ඊට දුන් පිළිතුරු වන්නේ රෑ දාවල් ඉක්මයන විට වයස ගෙවී මරණයට ළංවේ. එනමුත් පිං කිරීම එයින් ගැළවීමට මග නොවන නිසා ලෝකයට තියෙන ඇලීම නැති කළ යුතු බව ද ලෝකාමිසය හෙවත් සසර පැවැත්මේ හේතු නසා සසර නැවැත්ම කළ යුතු බව වදාළහ.

දිව්‍ය සැප විදින දෙවියන්ටද ජරා මරණාදී දුක් වලට මුහුණ දීමට වන බව එයින් ද පැහැදිලි වේ. පූර්ව නිමිත්ත සූත්‍රයට අනුව ජරා මරණ දොරටුවට

පැමිණි දේවතාවෙකුට අවවාදාත්මක ආශිර්වාද කිරීමක් දෙවියන් අතර තිබෙන බව ප්‍රකට වෙනව. ඒ වචන තුනකින් කියන ආසන්න බණකි. ඒ සඳහා නන්දන වනය හෙවත් මෝහණ වනයට රැස් වෙනවා. එතැන සුන්දර තැනකි. පස්කම් සැපය මෙහෙයවන ස්ථානයකි. මෙසේ දේවතාවාට කරුණු කියති.

''ඉතො භො සුගතිං ගච්ඡ '' (මෙයින් චුතව සුගතියට යව.) කුමක්ද ? මේ සුගතිය. මිනිස් ලොව උපතයි. මිනිස් ලොව වසන මනුෂ්‍යයන් වන අප බොහෝ විට සිතා සිටිනුයේ දෙව්ලොව එකම සුගතිය හැටියටයි. මේ බණ පදයට අනුව අප මිනිසුන් වශයෙන් උපත ලබා ඇත්තේ පෙර පිං කරන ලද නිසයි. කිසිම මිනිසෙක් උපතින් පව්කාරයෙකු නොවේ. සමහර විට මේ ජීවිතයේදී කරදර විපත් ලැබිය හැකිය. ඒ සසරදී කරන ලද පව්විපාක හේතුවෙනි. එනමුත් මිනිස් ආත්මයක් උරුමව උපදින සත්වයෝ ඉතා අල්පය. මිනිසත් බවින් පිට වෙනත් ජාතීන් හි උපදින සත්වයෝ බොහෝ වෙති. එමෙන්ම මිනිසත් බවක් ලැබීම ඉතා දුෂ්කරය. එසේම මිනිසෙකුව සිට පව්කම් කොට අපායගාමීවූවෙකුට නැවත මිනිසත් බවක් ලබා ගැනීම අතිශයින්ම දුෂ්කරය. ඊට හේතුව වන්නේ දුගතියෙහි පින් කිරීමේ පරිසරයක් නැති බැවිනි. දුගතිගාමී වීමට බලපෑ පාප කර්මයේ විපාක අවසන් වීමෙන් හෝ පෙර ආත්මභාවයකදී කරන ලද පුණ්‍ය ක්‍රියාවක විපාක දීමෙන් හෝ යළි මිනිසත් බවක් ලැබිය හැකිය. එසේ දුගතියක සිට මිනිසත් බවක් ලැබුවත් බොහෝ සෙයින් උපදින්නේ පාපයට බරවූ පරිසරයකයි. එසේම අතිශයින් දිළිඳු තත්වයක උපත ලැබුවහොත් හෝ සත්පුරුෂ ආශ්‍රයක් නැති වුනොත් බහු හෝ ඇය දුසිරිතෙහි යෙදී දුගතිගාමී වේ. ඒ බව මජ්ඣිම නිකායේ බාලපණ්ඩිත සූත්‍රයේ හොඳින් දැක්වේ.

මේ අනුව පැහැදිලි වන්නේ මිනිසත් බවක් ලැබීම මෙන්ම එය රැක ගැනීමද අතිශය දුෂ්කර බවයි. ඒ නිසා දෙවියන් ඥාණවන්තව මිනිස්ලොව සුගතිය ලෙසින්ම සලකයි.

මනුෂ්‍යයින් පිංකම් කොට දෙව්ලොව ප්‍රාර්ථනය කරද්දී අනෙක් දෙවියන් චුත වීමට ආසන්න වූ දෙවියන්ට කියන්නේ ''දෙව්ලොවින් චුතව මිනිස් ලොව නැමති සුගතියට යව'' යි යනුවෙනි. දෙව්ලොවම උපදීවායි කියන්නේ ද නැත. ප්‍රිය

විප්පයෝග දුක්ඛය ඇතිවන නිසා "දෙවිය නැවත නැවතත් මෙහි එව " යි සිත සතුටු කරවන බව මේ සූත්‍රයේ අවසන් ගාථාවෙහි දැක්වේ. මෙසේ කියනුයේ පෘථග්ජන භාවය ඉක්මනොවූ කාමාදී ආශ්‍රවයන්ගෙන් යුක්ත නිසාය. එනමුත් මිනිසත් බවෙහි වටිනාකම හොඳින් දන්නා සත්ව කොට්ඨාශයක් ලෙස දෙවියන් ඥාණවන්ත බව සංයුක්ත නිකායේ සක්ක නමස්සන සූත්‍රයේද " යම් ගිහියෙක් සිල්වත් ද ධර්මාණුකූලව දැහැමින් පෝෂණය වෙයි ද පුණ්‍යකාමීද මාතලිය මම එබඳු ගිහියාටයි හිස නමා ආචාර කරනුයේ " යන කියමනෙන් සනාථ වේ.

"සුගතිං ගනත්වා සුලද්ධ ලාභං ලබ" (සුගතියට ගොස් මනාකොට ලැබූ ලාභය ලබව.)

ඊළඟ ආශිර්වාදාත්මක අවවාදයෙන් ලොව ඇති එකම උසස්ම අසහාය ලාභය ලබන්න. උපදෙස් දෙනවා. උසස්ම ලාභය වන්නේ වතුපිටි ඉඩකඩම් යාන වාහන මුතු මැණික් ව්‍යාපාර. මිල මුදල්, ගව සම්පත් ආදිය නොවේ. තථාගත ධර්ම විනයෙන් ලබන ශ්‍රද්ධා ධනය හෙවත් එම ලාභයයි.

බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම විනය පවතිනුයේ මිනිස් ලොවයි. ඒ ධර්ම විනය පිළිබඳ අචල (නොසෙල්වන) ශ්‍රද්ධාවක් ලබන්න පුළුවන් වනුයේ මිනිස් ලොව පමණකි. මේ කාරණයෙනුත් දෙව්ලොවට වඩා මිනිස් ලොව උතුම් බව ඥාණවන්තයින් තේරුම් ගනිති.

ශ්‍රද්ධා ශබ්දය පළල් අර්ථයක් තිබුනද තුණුරුවන් කෙරෙහි අවංක විශ්වාසය ලෙස දැන ගැනීම ප්‍රමාණවත් වේ. තවත් ලෙසකින් කියන්නේ නම් හොඳහැටි තැබීමයි. කුමක් තැබීමද ?සිත් සතන් හොඳ හැටි තැබීමයි. කොහි හොඳ හැටි තැබීමද? බුදුරජාණන් වහන්සේ, සද්ධර්මය , ආර්ය සංඝයා, ත්‍රිවිධ ශික්ෂා, පෙර ජාතිය, මතු ජාතිය, පෙර මතු දෙජාතිය, සහ ප්‍රතීතපසමුත්පාද ධර්මය යන අට තැනෙහි හොඳ හැටි තැබීමයි.

ශ්‍රද්ධාව බීජයක් ලෙස කසී භාරද්වාජ සූත්‍රයේ දැක්වේ. බීජ වර්ග කීපයකි. මුල්, කඳ, ගෙඩි ආදී වශයෙනි. රෝපණය කළ විට වැඩෙන නිසා බීජ

යන අර්ථය දෙනවා. ශ්‍රද්ධාවද සියළු කුසලයන්ගේ ගුණයන්ගේ, කුසල සහ ගුණ බීජය වේ.වී ඇටය බීජයයි. බිමක රෝපණ ය කළ විට යටට මුල් ඇද උඩට අංකුර විත් යට මුලයෙන් පෘථුවි රසය හා ආපෝ රසය (ජලය) ඇද ගෙන නළයෙන් ඉහළට ගොස් කොළ සහ පඳුරු සැදී පීදි සිය ගණනින් ඇට සහිත කරල් ඇතිවේ. ශ්‍රද්ධා බීජයද සිතක රෝපණය වූ විට සීල නැමැති මුල බැස සමථ විදර්ශනා නැමැති රස ආර්ය මාර්ග නැමැති කඳින් (නළයෙන් ) ගෙන ගොස් ඥාණ විසුද්ධි වැඩී අරහත් ඵලය නැමැති අමා ඵලය නිපදවයි.

ලෞකික ලෝකෝත්තර දියුණුවේ මුල් අවස්ථාව ශ්‍රද්ධවායි. එම දියුණුව ඇති කරන නිසා ශ්‍රද්ධාව ධනයකි. ආයුෂය, නිරෝගීබව, ශරීර වර්ණය, දෙව් මිනිස් සැප, උසස් කුල සම්පත්, පස්කම් සැප යනාදී භවයෙහිදී ලැබිය යුතු ධනයයි. ලෝකෝත්තර ධනය වන්නේ සෝවාන් ආදී පිළිවෙලින් ලබන ධනයයි. මේ ලාභ ලැබීමේ ධන උල්පත ශ්‍රද්ධාවයි.

"සුලද්ධ ලාභං ලභිතවා සුපපතිට්ඨිතො භව" (සුලද්ධ ලාභය ලැබ සුපතිට්ඨිත වව) භාගයවතුන් වහන්සේගේ ධර්ම විනය දැන සවක්ඛාතාදී එහි ඇති ගුණ ඉගෙන විශ්වාසය මනාකොට ඇතිකර ගන්නා වූ තැනැත්තාට සෝවාන් ආදී මාර්ග ඵලයන්ගේ මූලධර්මයෙහි පිහිටන්න කියලා තුන්වෙනි අවවාදයෙන් පැහැදිලි කරනවා. මෙම සූත්‍රයේ "සා තේ සද්ධා නිවිට්ඨස්ස මූල ජාතා පතිට්ඨිතා" මූල ජාතා කියන වචනයෙන් පැහැදිලි වන්නේ සෝවාන් මාර්ගයේ මූල ධර්මයයි. එනම්, "සප්පුරිස සංසේවෝ, සද්ධම්ම සවණං, යෝනිසෝ මනසිකාරෝ, ධම්මානු ධම්ම පටිපත්ති, චත්තාරි සෝතාපත්ති යඞගානි මූලානි වේදිතබ්බාති" සත්පුරුෂ ආශ්‍රය , බණ ඇසීම , එය නුවණින් අවබෝධ කර ගැනීම, ඒ අනුව ජීවිතය සකස් කර ගැනීම. යන මේ සතර අංගයයි. මෙතැනදී

බෞද්ධයෙකුගේ ජීවිතයේ හැම කාරණයකදීම ඉලක්කයක් තිබිය යුතුයි. ඒ නැති කම නිසා වැරදි මගකට වැටිය හැකිය. ඒ මග හදා ගැනීමට මේ බණ පදය හොඳින් සිතෙහි යොදවා ගත යුතුමය. එය දේවගතිය කි.

මෙහිදී "මූල" කියන වචනය සෝවාන් වීමේ මූල ධර්ම ලෙස අංග 04 ක් දැක්වූවා. සෝවාන් වෙනවා යනු මෙහිදී සරළව දැක්වීම බණ පදය පැහැදිලි වීමට හේතු වනු ඇත. සත්වයා සසර බැඳ තබන බැම් 10ක් ඇත. එයින් තුනක් කඩා සුන් කිරීම සෝවාන් වීමයි. 01. සක්කාය දිට්ඨි (තම ශරීරය පිළිබඳ මමය මාගේය යන හැඟීම) 02. විචිකිච්ඡාව (තුණුරුවන් පිළිබඳව හෝ ධර්ම විනය පිළිබඳව හෝ යම් යම් තැන්වලදී ඇතිකර ගන්නා සැකය.) 03. සීලබ්බතපරාමාස (මිථ්‍යාවිශ්වාස වලින් සුගතියක් ඇතැයි බැසගත් වැරදි පිළිගැනීම්) මේ බැම් කඩා ගත් පුද්ගලයා සෝවාන් ඵල ලාභියා යනුවෙන් හඳුන්වයි. ඔහු සසර පැත්තට නොහැරේ. හත්වාරයකට වඩා සසරෙහි උප්පත්ති නොලබයි. මේ තත්වයට පත්වෙන්න මනුෂ්‍යයෙකු ලෙසින් මනුෂ්‍ය නාමයම දියුණු කොට ඉහත කී මූල ධර්ම හැටියට සඳහන් කළ ගුණ ධර්ම සම්පූර්ණ කර ගත යුතුය. දෙව් ලොව ඒ සඳහා පහසුකම් ඇති නොවේ. මනුෂ්‍යයෙකු ලෙසින් සෝවාන් මාර්ගාංග සම්පූර්ණ කළ විට ඔහු පත්වෙන ඒ තැන වෙනස් කරන්න "යාව ජීවං අසං හීරා සද්ධම්මේ සුප්පවේදිතේ" යන ආකාරයෙන් සූත්‍රයෙහි සඳහන් වනුයේ දිවි ඇති තෙක් ලබන ලද සුලද්ධ ලාභයෙහි පිහිටියාවූ එම ස්ථිරභාවය කිසිවෙකුටත් නැතිකළ නොහැකි බවයි.

තවද තුන්දොරින් වැරදි කොට පරමාර්ථ මනුෂ්‍යයෙකු ලෙසින් මනුෂ්‍ය තිරිසෙනෙක්, මනුෂ්‍ය ප්‍රේතයෙක්, නොවී මනුෂ්‍ය මනුෂ්‍යයෙකු වී දුසිරිතෙහි වැරුද්ද වටහා ගෙන සතර අපාය හිස් කරමින් අන්‍ය ලෝකයාටත් ආමිස ආදී දන් දෙමින් යහ මාර්ගය පෙන්වා දෙමින් බ්‍රහ්ම චරියාවෙහි පිහිටීමට අවවාද කරනවා.

අවසානයෙන් වදාල ගාථාවෙන් දැක්වෙනුයේ චුත වීමට ආසන්න දුකට පත්වී සිටින දේවතාවාට අනුකම්පාවෙන් මුලින් විස්තර කළ පරිදි අවවාද කොට "ඒහි දේව පුනප්පුනං" දේවතාවූ නැවත නැවතත් මෙහිද පැමිණීමට අමතක නොකරන්න කියා අස්වසනවා.

මෙහි මාතෘකා කළ පූර්ව නිමිත්ත සූත්‍රයෙන් ඉගැන්වෙන පරමාර්ථ මනුෂ්‍යයෙකු වශයෙන් ජීවත් වන පුද්ගලයාගේ ජීවිතය දේවාත්මභාවයකට වඩා උතුම් වන විදි ඉගෙන ගනිමු. එමෙන්ම එබඳු තත්වයකට පත්වන්න පුළුවන්

තැන මිනිස් ලොව බවද තේරුම්ගත යුතුය. අප ලබා ඇති මේ මිනිස් ජීවිතයේ වටිනාකම වටහාගෙන එයින් ගත යුතු උසස්ම ලාභය ලබා ගැනීමට උත්සාහවත් වෙමු.